# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,092 — 1960 මාර්තු 25 වැනි සිකුරාද — 25.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 233 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 236 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 236 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කල ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 245 | විවිධ දැන්වීම් ... ... ... | |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයීී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප් තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.

6. පුවත්පත් කලා පළපුරුද්දේ විස්තර :—

(අ) අවුරුදු ගණන :————.

(ආ) පළපුරුද්දේ ආකාරය :————.
(මේ සම්බන්ධයෙන් අමුණා ඇති සාක්ෂ්‍ය කවරේද ?)

7. චරිතය පිළිබඳ සහතික සැපයූ අයගේ නම් හා ලිපිනය :————.

8. සේවාමුක්ත භටයින් උදෙසා පිරිනැමෙන පහසුකම් ලබාගන්නේ ද යන වග :————.
(එසේ නම්, යුද සේවයෙන් අස්වීමේ සහතිකය හෝ ඒ පිළිබඳ අනෙක් ලියවිලි සාක්ෂ්‍ය ඇමිණිය යුතුයි.)

9. කිසි කලෙක රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ කවදා කොතැනද යන වග :————.
(එක් එක් දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය දක්වන්න) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12

### ශ්‍රේෂ්ඨාධිකරණ කාර්‍යාලයේ පිටපත් ගැනීමේ ඡායා යන්ත්‍රය ක්‍රියාකර වන්නකුගේ (ෆේපාටොස්ටැට් මැෂින් ඔපරේටර්) තනතුර

ශ්‍රේෂ්ඨාධිකරණයේ පිටපත් ගැනීමේ ඡායා යන්ත්‍රය ක්‍රියාකර වන්නකුගේ (ෆේපාටොස්ටැට් මැෂින් ඔපරේටර්) තනතුර සඳහා පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

පහත දැක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 අප්‍රේල් 9 වැනි දින දවල් 12 ට හෝ ඊට ප්‍රථම හෝ කොළඹ, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප.—මෙම තනතුරට නියමිත පඩිය අවුරුද්දකට රුපියල් 750කින් පටන් ගෙන අවුරුදු පතා රුපියල් 42 බැගින් වැඩිවී අවුරුද්දකට රුපියල් 1,296 දක්වා වැඩි වේ. තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද පරිදි ඔහු වැටුප් ක්‍රමයේ සුදුසු ස්ථානයක තැබීමට අවශ්‍ය වුවහොත් එය භාණ්ඩාගාරයේ ද අනුමැතිය ඇතුව කරනු ලැබේ.

3. සේවයේ කොන්දේසි :—මෙම තනතුර ස්ථිරවූද, විශ්‍රාම වැටුප් සහිතවූද එකකි. පත් කිරීම කරනුයේ අවුරුදු එකක පරීක්ෂණ කාල පරිච්ඡේදයකට යටත් කොටය.

4. අවශ්‍ය සුදුසුකම් :—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සුදුසුකම් ඔහු වෙත ඇති බව ඔප්පු කළ යුතුයි :—

1. 1960 අප්‍රේල් මස 9 වැනි දිනට ඔහුගේ වයස අවුරුදු 18 කට අඩුව හෝ අවුරුදු 35 කට වැඩිව හෝ නොතිබිය යුතුයි.

2. ඔහු ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වූ කෙනෙකු විය යුතුයි.

3. ඔහු පිටපත් ගැනීමේ ඡායා යන්ත්‍රය (ෆේපාටොස්ටැට් මැෂින්) ක්‍රියා කිරීමේ මනා පළපුරුද්දක් ඇති අයෙකු හා

4. විශිෂ්ඨ චරිතයක් සහ ශාරීරික සෞඛ්‍යයක් ඇත්තකු විය යුතුයි.

සැ. යු.—තමන් පිටපත් ගැනීමේ ඡායා යන්ත්‍ර ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය පුහුණුවක් ලබාගෙන ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් තැන වෙත මැනවින් ඔප්පු කිරීමට හැකි රජයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන්ට අධ්‍යාපන සුදුසුකම් ගැන නොතකා ඉල්ලුම් කිරීමට බලය තිබේ.

5. අයදුම් පත්‍රවලට—

අ. උප්පැන්න සහතික පත්‍ර ද (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය හෝ ප්‍රමාණවත් නොවේ.)

ආ. උසස්ම අධ්‍යාපන සහතික පත්‍ර ද, වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර සහ පිටපත් ගැනීමේ ඡායා යන්ත්‍ර ක්‍රියා කිරීමේ දැනුම ගැන සම්පූර්ණ වාර්තාවක් ද ;

ඉ. අයදුම්කරුගේ සුදුසුකම් හා චරිතය මෙම තනතුරට සුදුසු බව සඳහන් කරමින් ලඟදී ලබා ගන්නා ලද සහතික පත්‍ර 3 ක ද (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයගෙන් මෙම සහතික අවශ්‍ය නොවේ.)

පිටපත් අමුණා එවිය යුතුයි.

සැ. යු.—මෙම සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරු වලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුයි.

7. කිසියම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය. යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

8. මෙම ගැසට් පත්‍රයෙහි I වැනි කොටසේ II වැනි ඡේදයේ පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම්වලට ද අදාලවූද පොදු කොන්දේසි කියවා බලන ලෙස ඉල්ලමි.

ජේ. ඩබ්ලිව්. සුබසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් තැන.

1960 මාර්තු 16 දින,
කොළඹ, ශ්‍රේෂ්ඨාධිකරණ කාර්‍යාලයේ දීය.

### ආකෘති පත්‍රය

### ශ්‍රේෂ්ඨාධිකරණය

### ශ්‍රේෂ්ඨාධිකරණ කාර්‍යාලයේ පිටපත් ගැනීමේ ඡායා යන්ත්‍රය ක්‍රියා කරවන්නකුගේ (ෆේපාටොස්ටැට් මැෂින් ඔපරේටර්) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. අ. ජාතිය හා පුරවැසිකම ලැබුණේ පරම්පරාවෙන් ද ලියා පදිංචි වීමෙන් ද යන වග :————.

ආ. උපන් ස්ථානය :————.

(1) ඉල්ලුම්කරු :————.

(2) ඉල්ලුම්කරුගේ පියා :————.

(3) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ ආතා :————.

(4) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.

සැ. යු :—ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ පියා ලංකාවේ උපත ලැබුවේ නම් (1) හා (2) සම්පූර්ණ කිරීම සෑහේ. ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ පියා උපත ලැබුවේ ලංකාවේ නොවේ නම් (1), (2), (3) සහ (4) සම්පූර්ණ කළයුතුයි.

4. උපන් දිනය :————.

5. විවාහකද, අවිවාහකද යන වග :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. පිටපත් ගැනීමේ යන්ත්‍රය (ෆේපාටොස්ටැට් මැෂින්) ක්‍රියා කිරීම පිළිබඳ පළපුරුද්ද සහ දැනීම :————.

8. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද :————.

9. සිංහල/දෙමළ පිළිබඳ දැනීම :————.

10. පාඨශාලාවෙන් අස්වූවාට පසු කළ රැකියාව :————.

11. දැන් රැකියාව :————.

12. මෙම තනතුරට අදාල වෙනත් විශේෂ සුදුසුකම් :————.

13. අවශ්‍ය වුවහොත් චරිතය හා දක්ෂතාවය ගැන තොරතුරු ලබා ගැනීම සඳහා දන්නා අඳුනන තිදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

14. සහතික පත්‍ර :————.
(ළඟදී ලබාගත් සහතික පත්‍ර තුනක පිටපත් ඇමිණිය යුතුයි.)

..........................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—..................................

---

## ලංකා කාර්මික විද්‍යාලීය දෙපාර්තමේන්තුව

### බාහිර උපදේශක තනතුරු-කණිෂ්ඨ කාර්මික විද්‍යාලය, මහනුවර

මහනුවර කණිෂ්ඨ කාර්මික පාඨශාලාවේ බාහිර උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර බාර ගනු ලැබේ. 1960 අප්‍රේල් මස 18 වැනි දින හෝ ඊට පෙර මහනුවර කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ විද්‍යාලයාධිපති තැන වෙත ලැබෙන සේ සියළුම ඉල්ලුම් පත්‍ර යැවිය

යුතුයි. අපේක්‍ෂකයන් විසින් තමන්ගේ අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් හා තමන්ගේ පලපුරුද්ද පිළිබඳව සියලුම විස්තර සඳහන් කළ යුතුයි.

තනතුරු

| | |
|---|---|
| ලඝු ලේඛනය හා යතුරු ලියනය | (ඉංග්‍රීසි-සිංහල) |
| ගණන් තැබීම | ( „ „ ) |
| වාණිජ භූගෝල විද්‍යාව | ( " " ) |
| වාණිජ විද්‍යා මූලධර්ම | ( „ „ ) |
| සිංහල භාෂාව | ( „ „ ) |
| වාණිජ අංකගණිතය | ( „ „ ) |
| ඉංග්‍රීසි භාෂාව | ( " " ) |

බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව වේ.

**රක්ෂාවේ කොන්දේසි**

මෙම තනතුරු අවුරුද්දේ ජූනි මාසයේ පටන් ගෙන ඊළඟ අවුරුද්දේ මාර්තු මාසයෙන් අවසන් වේ.

පංති පවත්වනුයේ උදේ 8.30 හේ සිට සවස 4.30 දක්වා හෙයින්, මේ කාලය ඇතුලත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාලවේලා ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුයි.

බාහිර උපදේශක වරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්‍ෂණයන් හිද සහ අභ්‍යන්තර නොවූ පරීක්‍ෂකයන් නො යොදවන වර්‍ෂාවසාන පරීක්‍ෂණයන් හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්ති වල ශිෂ්‍යයන් පරීක්‍ෂා කළ යුතුයි.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්‍ෂක.

1960 මාර්තු මස 21 දින,
කොළඹ 10 යේ ලංකා කාර්මික
විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේදීය.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංක : ඊ. බී. ඒ. 21/59.

## වර්‍ෂ 1959ක් වූ සැප්තැම්බර් මස පැවැත්වුණු ආරෝග්‍යශාලා ලිපිකරු විභාගයේ ප්‍රතිඵල

වර්‍ෂ 1959 ක් වූ සැප්තැම්බර් මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකරු විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අයදුම්කරුවන් ආරෝග්‍ය ශාලා ලිපිකරු සේවයේ II වැනි පන්තියේ ලිපිකරු තනතුරුවලට පත් කිරීම් සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

| නම | ලිපිනය |
|---|---|
| අබේරත්න, ජී. ඇම්. ... | කනතදණ්ඩ, පදියපැලැල්ල. |
| අරමුගම්, වී. ... | කොට්ඨාශ අංක 3, මුදලායික්කුඩ. බීටී./කොක්කට්චෝලායි. |
| අබේරත්න, යූ. පී. ... | 42, පැපිලියාන, බොරලැස්ගමුව. |
| ඇල්බට්, පී. එච්. ... | ගොඩළුඩ, කෝට්ටේගොඩ. |
| බාලසුබ්‍රමනියම්, වී. ... | නැගෙනහිර සරවනායි, වේලනෙ. |
| ඩයස්, කේ. ජී. ... | මධ්‍යම පාසැල, රුවන්වැල්ල. |
| ඩග්ලස්, ඒ. ඒ. ... | "සිගිරි" මාගම්මන, හෝමාගම. |
| ද සිල්වා, ඩබ්ලිව්. පී. බී. බී. | පලමුවෙනි පටුමාවත, අළුත්ගම. |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. ඊ. ඇල්. | කොවිලගොඩවත්ත, බෝපේ, ගාල්ල. |
| ප්‍රනාන්දු, ඇන්. සී. ... | "සිසිර" 150 ජයමාවත, උතුරු කළුතර. |
| ගුණසේන, ඇන්. වී. කේ. ඇම්. ඩී. | පැලවත්ත, සිරිමාවත, නායිමාන, මාතර. |
| හේරත් බණ්ඩා, ඩබ්ලිව්. ඒ. | "විජය සේවන", බැවිල්ගමුව, හදුගල, පොතුහැර. |
| හේමානන්ද, ජී. ඒ. ... | නාඹටුන්න, කෝට්ටෙගොඩ. |
| ඉන්ද්‍රරත්න, බී. ඇල්. ... | මුගුණුවටවන, මාදම්පෙ. |
| ජිනදාස, ජී. ... | රජයේ ජ්‍යෙෂ්ඨ පාසැල, බණ්ඩාරවෙල. |
| ජයවර්ධන, එච්. ... | ඉහළ ලෙල්වල, වඳුරඹ. |
| ජයසේකර, ඩබ්ලිව්. ඇම්. | දිවිගලපිටිය, කැප්පෙටිපොල. |
| ජිනසේන, ඩබ්ලිව්. ආර්. ඩී. | අංක 276, මුහුදු වෙරල පාර අඟුලාන, මොරටුව. |
| කරුණාරත්න, ආර්. ඩී. | අරළුපොලවත්ත, අඹන්පිටිය. |
| කරුණාදාස, ඩී. වයි. ... | බැරැදිගොඩ, ඉඹුල්ගොඩ, අකුරැස්ස. |
| කාරියවසම්, ටී. ජී. කේ. | ගුරුකන්දවත්ත, තිරණාගම, හික්කඩුව |
| කමලසේන, පී. ඇන්. පී. | අංක 205/1, ගොන්දෙන්නාව, නාවලපිටිය. |
| කරුණාදාස, කේ. ඒ. ... | අංක 55, පෙට්ටියගලවත්ත, ගාල්ල. |
| කනපති පිල්ලේ, ඒ. ... | ඇස්. විස්වනාදන් මහතා බාරේ, වානෙරි, කරවෙඩ්ඩි. |
| නාගලිංගම්, කේ. ... | රජයේ මධ්‍යම පාසැල, වසාවිලාන්. |
| නිමලරත්න, ඇම්. ඒ. ... | අරුග්ගම්මන, කොටියාකුඹුර. |
| ඔසිනස් වාස්, ඩබ්ලිව්. ... | පඹල, කාක්කාපල්ලිය. |
| පියසේන, කේ. එච්. ... | දලවැල්ල, උණවටුන. |
| පෙරේරා, කේ. ඩබ්ලිව්. එච්. | වෙරළුපිටිය, පුවක්පිටිය. |
| පියතිලක, එච්. පී. ... | මරද පාර, නාත්තන්ඩිය. |
| පීටර්, ආර්. එච්. ... | කපුවරළ, අලව්ව. |
| ජේමසිරි, ඇස්. ... | සමාජ සේවා අංශය, කච්චේරිය, අනුරාධපුරය. |
| රාජපක්ෂ, ආර්. ඇම්. ඒ. | උඩකඩවල, පලුගස්වැව. |
| සබානාදන්, කේ. ... | ඇස්. කදිරතම්බි මහතා බාරේ, උතුරු තවඩි, කොකුවිල්. |
| ෂමුගලිංගම්, ඇස්. ... | කලෙයිමගල් වීදිය, තයිඩ්ඩි, කන්කසන්තුරේ. |
| සේනානායක, ඩබ්ලිව්. පී. ජී. ඩී. | මැද්දේගෙදර, කටුගහගේන. |
| සන්දිර සේගරම්, ඇන්. | ෆ්‍රේසෙස්ටර් වත්ත, ගෝවින්න. |
| සිරිසෝම, ඇම්. ඒ. ... | පන්සලපාර, වැවිට බණ්ඩාරගම. |
| ස්ටීවන්, ඇම්. ඒ. ... | කටන්ගොඩ වත්ත, දකුණු බද්දෙගම, බද්දෙගම. |
| සෝමසේගරම්, පිල්ලෙයි වී. | බටහිර වේලන, වේලන. |
| සුමනදාස, ජී. ඇම්. ඩබ්ලිව්. | ලුණුකලපුව, කෝට්ටගොඩ. |
| සේනානායක, ඩී. ඇන්. | 16/7, ගොඩිගමුව, රත්නපුර. |
| සෙන්තිවේල්, කේ. ... | උතුරු තුන්නලායි, කරවෙඩ්ඩි. |
| සිවසුබ්‍රමනියම්, පී. ... | නාවත්කුලි, කයිතඩි. |
| සේනාරත්න, එච්. ඩී. ඇස්. | ගෝනාගල, ඉඳුරුව. |
| සෙනෙවිරත්න, එච්. පී. | කේ.ජී./උඩුවෙවෙල රජයේ මිශ්‍ර පාසැල, ගලතර. |
| සෙල්වරත්නම්, ඒ. ... | මූල්ලනේ, ඉලවාලෙයි. |
| සමරපාල, ජී. එච්. ඩී. ... | "සිසිර" ගිනිමැලේගහ, බද්දෙගම. |
| තුරෙයිරත්නම්, ඒ. ජේ. | ඒ. පොන්රාජා නෝනාමහත්මිය බාරේ, නැගෙනහිර කරප්පන්, කයිට්ස්. |
| විල්සන්, ආර්. ඩබ්ලිව්. එච්. | බොරළුකැටිය, අගුළුගහ, ගාල්ල. |
| විජේතිලක, ජී. කේ. ඇම්. බී. | "විජයගිරි" උතුරු තල්පේ, උණවටුන. |
| විමලරත්න, ජී. ඩී. ... | කොළඹ පාර පොකුණුවිට. |

මේ අයදුම්කරුවන්ට එක වරම පත්වීම් ලබාදීමට දෙපාර්තමේන්තුව බැඳී නැත. දෙපාර්තමේන්තුවේ ඇබෑර්තු ඇතිවන ආකාරය අනුව, ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සෑම පත්වීමක් ම අවුරුදු තුනක කාලයක් ගතවනතුරු ආධුනික තත්වයේ තබනවා ඇත. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ සේවා කොන්දේසි වලට ද යටත් විය යුතු ය.

ඩබ්ලිව්. ඒ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ.
1960 මාර්තු මස 16 වැනි දින දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් කුණ්ඩසාලේ රජයේ ගොවිපලට පහත සඳහන් දේ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අප්‍රියෙල් මස 14 වෙනි දින පස්වරු 2.30 වන තෙක් බාර ගනු ලැබේ :—

අඟල් 10ක් දිග අඟල් 3ක් ඇතුළත විෂ්කම්භය ඇති කහ උණ බම්බු ... 50,000

අඟල් 14ක් දිග අඟල් 4ක් ඇතුළත විෂ්කම්භය ඇති යෝධ උණ බම්බු ... 20,000

2. කුණ්ඩසාලේ කෘෂිකර්ම උප කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන ගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටැන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයෙක දමා සීල් තබා "සභාපති

ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි කුණ්ඩසාලේ ගොවිපලට කහ උණ බම්බු සඳහා ටෙන්ඩර් පත්‍රය යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "කුණ්ඩසාලේ ගොවිපලට කහ උණ බම්බු සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේ දීම සියළු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නො ලැබුනොත් ඔහු මධ්‍යම කොට්ඨාශයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ යට කී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන් සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

7. පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්ට ඉඩ තිබේ.

නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

8. ටෙන්ඩර් කරුවන් නම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල මුලු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිම වූ විට පමණකි. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබා ගනී.

12. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

13. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. කොන්ත්‍රාත් කාරයාට බාර දිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වත් වෙනස් නොවන සවිර ඒවා විය යුතුයි.

18. වැඩි විස්තර කුණ්ඩසාලේ කෘෂිකර්ම උප කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබා ගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1960 මාර්තු මස 12 වැනි දින,
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### විදිලි බලයෙන් ක්‍රියා කරන ඉසීම් උපකරණ සඳහා ටෙන්ඩර්

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් පහත සඳහන් විස්තරයට අනුකූලවූ විදුලි බලයෙන් ක්‍රියා කරන ඉසීම් උපකරණ 9ක් සැපයීම සඳහා 1960 වේ අප්‍රේල් මස 8 වැනි දින පස්වරු 2.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

ආසන්න උස : අඟල් 14 යි.

ආසන්න පළල : අඟල් 11 යි.

ආසන්න දිග : අඟල් 14 යි.

ආසන්න බර : රාත්තල් 35 යි.

කරකවන ඇණය : මිනිත්තුවකට කරකැවිය යුතු වාර 100-200 දක්වාය.

චූෂණ ධාරිකාව : මිනිත්තුවකට ගැලුම් 4 සිට 8 දක්වාය.

උපරිම පීඩනය : සතරැස් අඟලකට රාත්තල් 500 යි.

සාමාන්‍ය පීඩනය : රාත්තල් 300 යි.

අවශ්‍ය බලය : අශ්ව බල 2 සිට 3 දක්වාය.

අමතර උපකරණ : ගොයම් පළතුරු හා වෙනත් බෝගවලට බෙහෙත් ඉසීම සඳහා නළ මුඛය, ලංස, දියර විසුරුවන හම් නළය, ආයුධ හා අතිරේක වොෂරය.

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගෙන් "පෝර්ම" කොළ ලබාගෙන ඒවා පිරවීමෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් පුරවා අත්සන් තැබිය යුතු අතර ඒවා බහාලන කවරය සීල් තබා, "පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා" යනුවෙන් ලිපිනය ලියා එහිම මුදුන් කෙළවරෙහි "විදුලි බලයෙන් ක්‍රියා කරන ඉසීම් උපකරන සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න සඳහන් කොට එවිය යුතුයි.

3. ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් වෙත 1960 අප්‍රියෙල් 6 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරන්නේ එක් එක් ටෙන්ඩරයක් වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ මුදල කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ තැන්පත් කළ යුතුය. තෝරාගත් ටෙන්ඩර් කරු විසින් පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු මේ මුදල ආපසු දෙනු ලැබේ. තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින 10 ක් තුළදී අවශ්‍ය ඇපය තැබීමට අපොහොසත් වුවහොත් හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුවහොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුට විරුඬව රජය මඟින් ඉදිරිපත් කළ හැකි කවර අන්දමේ හිමිකම් පෑමකට හෝ අයිතියක් නොවන පරිදි ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන විට ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් පිළිබඳ ලිපිකරුට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "විදුලි බලයෙන් ක්‍රියාකරන ඉසීම් උපකරණ සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්

12. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්‍ය්‍යය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ එහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. වර්ෂ 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥා පණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවක යෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂකතුමා විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. වැඩි විස්තර යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

වර්ෂ 1960 මාර්තු මස 16 වැනිදා,
පේරාදෙණියේදී ය.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැයකට වී ටොන් 2-2½ ක් කෙටිය හැකි මෝලක් සහ තෙල් ඇන්ජිමක් සැපයීම සඳහා ප්‍රසිඩ නිෂ්පාදකයින්ගෙන් හා වෙළඳුන්ගෙන් කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර 1960 අප්‍රියෙල් මස 29 වෙනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

කොළඹ ඩීන්ස් පාරේ අංක 336 දරණ ස්ථානයෙහි පිහිටා තිබෙන ගොවිජන සේවා කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1960 අප්‍රියෙල් මස 29 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන අනුපිටපතක්ද සහිතව පුරවා එවිය යුතුය. මේ සම්බන්ධව රු. 500 ක තැන්පත් මුදලක් කොළඹ හෝර්ටන් පෙදෙසෙහි අංක 60 දරණ ස්ථානයෙහි පිහිටා තිබෙන ගොවිජන සේවා කොමසාරිස් තුමාගේ කාර්යාලයට ගෙවා කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ ඩීන්ස් පාරේ අංක 336 දරණ ස්ථානයෙහි පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම) කාර්යාලයෙන් ලබාගත හැකිය.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම).

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10,
1960-3-25.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් බදුලුඔය ව්‍යාපාරයේ අංක 3 දරණ ජල බෙදන ඇලේ හා අතුරු ඇලවල්වල ගල් ඇල්ලීම්, ඇලි සෑදීම්, ජල පාලක වක්කඩවල් හා අගාවන පලක බැමි ආදීය සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත් 1960 අප්‍රියෙල් 20 වැනි බදාදා පෙරවරු 10 තෙක් මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 15,700 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත වියයුතුය. අවශ්‍ය පෝර්ම බදුල්ලේ උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ඇති සැළසුම් සහ අනිකුත් විස්තර ඔහුගේ කාර්‍ය්‍යාලයේ දී පරීක්ෂාකළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කළ හැකි හා රුපියල් 25 ක් කච්චේරියක හෝ බදුල්ල වාරිමාර්ග කාර්‍ය්‍යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයවළුන්ට පමණක් 1960 අප්‍රියෙල් 19 වැනි දින තෙක් ටෙන්ඩර්පත් නිකුත් කරණු ලැබේ.

ඇ. ජේ. ප්‍රි. පොන්රාජා,
බදුල්ල වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 මාර්තු 15 දින,
බදුල්ල වාරිමාර්ග කාර්‍ය්‍යාලයේදී.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර මධ්‍යම දිශාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නාලන්ද උප කොට්ඨාශයෙහි පහත සඳහන් වැඩ සඳහා 1960 අප්‍රේල් මස 20 වන බදාදා පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| වැඩ විස්තර | ලියාපදිංචි විය යුතු ගණන | තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|
| මහනුවර-දඹුල්ල පාරේ බෝවතැන්න ජලාශ ක්‍රමයට යන මාර්ගය අලුත් වැඩියා කිරීම | රුපියල් 12,000 හෝ ඊට වැඩියෙන් | රුපියල් 25 |

තැන්පත් කළ යුතු මුදල, නාලන්ද වාරිමාර්ග කාර්‍ය්‍යාලයෙහි තැන්පත් කොට හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1960.3.26 සිට 1960.4.19 දින දක්වා ටෙන්ඩර් පත්‍ර නාලන්ද වාරිමාර්ග කාර්‍ය්‍යාලයෙන් ලබාගත හැක.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් වැඩ කරගෙන යන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ වැඩවල තත්ත්වය පිළිබඳ සහතිකයක් එම වැඩ භාර නිලධාරි තැනගෙන් ඉදිරිපත් කළ යුතුයි.

මහනුවර මධ්‍යම දිශාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අප්‍රේල් මස 20 වන බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන වේලාවට යම්කිසි කොන්ත්‍රාත්කරුවෙකුට උවමනා නම් එහි සිටිය හැක.

උප කොට්ඨාශ භාර නිලධාරි තැන,
නාලන්ද.

වාරිමාර්ග කාර්‍ය්‍යාලය,
නාලන්ද, 11.3.1960.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් මොණරාගල උප කොට්ඨාශයේ හදපානාගල ව්‍යාපාරයට යන පාරට කළුගල් සහ තාර දැමීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1960.4.27 වෙනි දින පෙරවරු 10 වනතෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය පෝරම මොණරාගලං උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරි තැන ගෙන් ලබාගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබාගත හැකි අතර මේ සඳහා ඇති සැලසුම් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 48,000 හෝ ඊට වැඩි ගණන කට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කළ හැකි හා රුපියල් 50ක් කච්චේරියක හෝ වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයවළුන්ට පමණක් 1960.4.26 වෙනි දින තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

උ. කො. භා. වා. මා. නිලධාරිතැන.
මොණරාගල උ. කො.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් බදුල්ලේ අංක 3 දරණ ජෝඩු කම්කරු නිවාසය සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1960 අප්‍රියෙල් 20 වැනි බදාදා උදය 10 වනතෙක් මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 15,500 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝර්ම අනුපිටපතකින් සමන්විත විය යුතුය. අවශ්‍ය පෝර්ම බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ඇති සැළසුම් සහ අනිකුත් විස්තර ඔහුගේ කාර්‍ය්‍යාලයේ දී පරීක්ෂා කළ හැකිය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් වර්‍ෂ 1960ක්වූ අප්‍රියෙල් මස 6 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| අංකය | මෙහෙය පිළිබඳ විස්තර | ලියාපදිංචි වී ඇති ප්‍රමාණය රු. ශත | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත | |
|---|---|---|---|---|---|
| 1. | රාජාංගණයට පිවිසෙන පාරට ලොකු කලු ගල් අතුරා, සක්ක ගල් අල්ලා ඒ මතුපිට තාර දැමීම පළමුවෙනි සැතපුම ... | 40,000 | 0... | 50 | 0 |
| 2. | එම දෙවෙනි සැතපුම ... | 40,000 | 0 | 50 | 0 |
| 3. | එම තුන්වෙනි සැතපුම ... | 40,000 | 0... | 50 | 0 |
| 4. | එම සතරවෙනි සැතපුම ... | 40,000 | 0... | 50 | 0 |
| 5. | එම පස්වෙනි සැතපුම ... | 40,000 | 0... | 50 | 0 |
| 6. | රාජාංගණ වැව සමීපයෙහි කණිෂ්ඨ නිලධාරීන්ගේ නිවාසයක් ඉදිකිරීම ... | 25,000 | 0... | 25 | 0 |
| 7. | රාජාංගණ වැව සමීපයෙහි කම්කරුවන්ගේ ස්ථිර නිවාසයක් ඉදි කිරීම ... | 15,000 | 0... | 25 | 0 |

2. ඉහත සඳහන් සේවාවන්ට ඉදිරියෙන් දැක්වෙන පරිදි මුදල් ප්‍රමාණයකට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ටෙන්ඩර් දැමීමට සුදුස්සෝ වෙති.

3. ටෙන්ඩර් දැමිය යුත්තේ රාජාංගණ උප කොටසෙහි වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර පිටපත් දෙකකිණි. මේ සඳහා වැඩි විස්තරද එම කායඹාලයෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1960 මාර්තු 25 වෙනිදා සිට අප්‍රියෙල් 5 වෙනි දින දක්වා කාර්යාලයේ වැඩ කරන වේලාවන්හිදී පමණක් ලබා ගත හැක.

පී. ආර්. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
රාජාංගණ උප කොටස.

වාරිමාර්ග කායඹාලය,
ගල්ගමුව, 15. 3. 1960.

---

## වාරිමාගී දෙපාතීමේන්තුව

